හඳුනා නොගත් තැනැත්තියකගේ මළසිරුර වෙල්ල වීදියේ දමා ගිය සූට්කේසයකින් හමුවීමේ පුවත මාර්තු 02 දින මාධ්‍ය බොහෝමයක් මගින් ප්‍රමුඛව වාර්තා කොට තිබිණි. එහිදී දිවයින පුවත්පතේ ප්‍රධාන පිටුවේ පළමු පුවත ලෙසින් එය වාර්තා වී තිබූ අතර, එම සූට්කේසය තුළ තිබූ කාන්තා මළසිරුරේ පැහැදිලි ඡායාරූපයක්ද පළ වී තිබිණි. දිවයින පුවත්පතේ සහෝදර පුවත්පත වන The Island පුවත්පතේ පළමු පිටුවේ අතුරු පුවතක් ලෙසින් මෙම ප්‍රවෘත්තිය දැක්වී තිබූ අතර, එහි මළ සිරුරේ ඡායාරූපයක් පළවී නොතිබුණි.

මෙම පුවත වාර්තා කර තිබූ අනෙකුත් භාෂා පුවත්පත් වන අද, අරුණ, මව්බිම, ලංකාදීප සහ The Morning පුවත්පත් (03/02) තුළද ප්‍රවෘත්තිය සමගින් අදාළ සූට්කේසයේ ඡායාරූප පළවී තිබූ නමුත්, ඉන් එකක හෝ මළසිරුරේ ඡායාරූපයක් පළවී නොතිබුණි. දිනමිණ පුවත්පතේ අදාළ ප්‍රවෘත්තිය පළ වී තිබුණද, කිසිදු ඡායාරූපයක් දැක්වී නොතිබුණි.

ප්‍රචණ්ඩත්වය සම්බන්ධ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවයෙන් සහ විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්ව ඉදිරිපත් කිරීමට මාධ්‍ය වෙසෙසින්ම සැලකිලිමත් විය යුතු බව මාධ්‍ය ආචාර ධර්මයන් තුළ දැක්වෙයි. මෙහිදී මෙවැනි සංවේදී ඡායාරූපයක් නැරඹීමට අපහසු අයවලුන්ද සිටිනා බව මෙහිදී සැලකිල්ලට ගත යුතු වේ. එසේම එවැනි ඡායාරූපයක් පළ කිරීමේ සදාචාරාත්මක බවද ප්‍රශ්නකාරී වෙයි.

මේ අනුව ගත් විට, අනෙකුත් පුවත්පත් තුළ පළ නොකරන්නට ප්‍රවේසම් වූ කාන්තා මළ සිරුරේ ඡායාරූපය දිවයින පුවත්පත ඔස්සේ පළ වීම සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද? ඒ ඔස්සේ දිවයින මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් සිදුකර ඇතැයි ඔබ සිතන්නේද?

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #Divaina